**විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - 2021**

---

විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3698 එස්ආර්අයි හා 3699 එස්ආර්අයි (සීඑල්) ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කැලණිය, රජරට, සබරගමුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ උසස් අධ්‍යාපන පද්ධතියට රැකියාභිමුඛ තාක්‍ෂණික උපාධි වැඩසටහන් ඇතුළත් කිරීමේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 30,051.45කට සමාන එ.ජ.ඩො මිලියන 165ක් වූ අතර ඉන් රු.මිලියන 26,408.45කට සමාන එ.ජ.ඩො මිලියන 145ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු  සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අප්‍රේල් 17 දින පසුගාමී මූල්‍යනය යටතේ ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

-----

මාගේ වාර්තාවේ  2වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන  විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට කැළණිය සහ රජරට විශ්ව විද්‍යාලයේ ලී බඩු සහ සවිකිරීම්, පොත් සහ මෘදුකාංගවල ශේෂය රු.මිලියන 625.99ක් විය. කෙසේවෙතත්, එම විශ්ව විද්‍යාලවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛණවලට අනුව වත්කම්වල අනුරූපී වටිනාකම රු.මිලියන 576.10ක් ලෙස දක්වා තිබුණි. | නිසි පරිදි පිළිතුරු සපයා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අනුරූපී ශේෂයන් අදාළ විශ්ව විද්‍යාලවල වාර්තා සමග කාලීනව සංසන්දනය කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සබරගමුව විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලීබඩු සහ සවිකිරීම්, පොත් සහ මෘදුකාංගවල ශේෂය එම විශ්ව විද්‍යාලවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක පවත්වාගෙන යන ස්ථාවර වත්කම් ලේඛණවල දැක්වූ රු.මිලියන 476.53ක ශේෂය එදිනට ව්‍යාපෘතියේ ප්‍රකාශනවල දක්වන ලද රු.මිලියන 411.82ක වටිනාකම සමඟ සැසඳීම කර නොතිබුණි. | නිසි පරිදි පිළිතුරු සපයා නොතිබුණි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ලීබඩු සහ උපකරණ, පොත් සහ පරිගණක මෘදුකාංගවල ශේෂය වූ රු.මිලියන 1,096.3ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛණයේ දැක්වෙන රු.මිලියන 1,100.73ක වටිනාකම සමඟ සංසන්දනය කර නොතිබුණි. | කොවිඩ් 19 ආරක්ෂිත උපකරණ මිලදී ගැනීම 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස හඳුනාගෙන කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත. | ලීබඩු සහ උපකරණ, පොත් සහ පරිගණක මෘදුකාංගවල ශේෂය උපලේඛණ සමඟ සමාන විය යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට අතුරු ගෙවීම් සහතිකවලින් අඩුකර ගන්නා ලද රු.මිලියන 230.9ක රඳවාගත් මුදල් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 5% රඳවා තබාගත් මුදල් සඳහා වෙන් කිරීමක් සිදු කිරීමට සටහන් කර ගන්නා ලදි. | රඳවා තබාගත් මුදල් පිළිබඳව ගිණුම්වල සටහන් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 05 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, නවීන තාක්ෂණය සහ කාර්මික අංශයට අදාළ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, කාර්මික ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග ගැලපෙන ආකාරයට ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීමට සහ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා සහයවීම, තරඟකාරි කර්මාන්ත සහ විදේශ විශ්ව විද්‍යාල සහයෝගීතා යෝජනා ක්‍රම සහ ධාරිතා වර්ධන අවස්ථා ලබාදීම සහ 2021 වර්ෂයේ අනුමැතිය සඳහා යෝජනා කරන නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සකස් කිරීමේදී රජයට සහය ලබාදීම.

**3.2 ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | | | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික කාර්යසාධනය | | මූල්‍ය කාර්යසාධනය | | | |
| | | අපේක්ෂිත ප්‍රගතිය (%) | ලඟාකරගත් ප්‍රගතිය (%) | අපේක්ෂිත ප්‍රගතිය (%) | ලඟාකරගත් ප්‍රගතිය (%) | | |
| (අ) | රජරට විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2.8 | 2.1 | 26.66 | 20 | ඉදිකිරීම් කටයුතුවල කාර්යසාධනයට අහිතකර ලෙස කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපෑවද ව්‍යාපෘතියට අපේක්ෂිත භෞතික හා මූල්‍ය කාර්යසාධනය හොඳ මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට පියවර ගැනීම අවශ්‍ය අතර අමතර පිරිවැය ඇතිවීම වැළැක්වීමට කොන්ත්‍රාත් කටයුතු කාලීනව නිම කිරීමට සහතික විය යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 10 | 07 | .41 | 26.83 | -එම- | -එම- |
| (ඇ) | සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 56 | 40 | 46.84 | 41.64 | -එම- | -එම- |
| (ඈ) | කැළණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 68 | 43 | 45.9 | 45.71 | -එම- | -එම- |

### 3.3 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | සංරචකය | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කාර්මික ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග ගැලපෙන ආකාරයට ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීමට සහ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා සහයවීම | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව 2023 වර්ෂය අවසාන වන විට කලින් තීරණය කරන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ අවම සියයට 80ක ප්‍රමාණයක් නිම කළ යුතුව ඇත. කෙසේවෙතත්, 2021 වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාල දෙකක අධ්‍යයන කාර්යමණ්ඩල 11 දෙනෙකු පමණක් ඔවුන්ගේ දර්ශනපති ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භ කර තිබුණු අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තිදෙනෙකු ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් ආරම්භ කර තිබුණි. තවද, එක් කථිකාචාර්යවරයෙකු රු.මිලියන 1.98 වියදම් කිරීමෙන් පසුව දර්ශනපති ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන නතර කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 01ක් පමණක් නැවත අයකරගෙන තිබුණි. 2022 අප්‍රේල් 30 විගණිත දින වන විටත් එම කථිකාචාර්යවරයාගෙන් ඉතිරි මුදල නැවත අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | යටත්වල මහත්මියගේ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලෙන් සහ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමෙන් පසුව ඉතිරි මුදල නැවත එවීමට විශ්වවිද්‍යාලය එකඟවී ඇත. කැළණිය විශ්වවිද්‍යාලය යටත්වල මහත්මියගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් මේවන විටත් අයකරගෙන ඇත. ඉතිරි මුදල අයකර ගැනීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පසුවිපරම් කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය අතර අදාළ කථිකාචාර්යවරයාගෙන් ඉතිරි මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | | රජරට විශ්වවිද්‍යාලය වෙත දිගුකාලීන පුහුණු මත කරන ලද එ.ජ.ඩො මිලියන 1,000ක වෙන් කිරීමෙන් ඒ සඳහා එ.ජ.ඩො මිලියන 529.28ක් පමණක් වැයකර තිබුණු අතර උපයෝජනය නොකළ මුදල ප්‍රතිපාදනයෙන් සියයට 47.1ක් විය. සබරගමු විශ්වවිද්‍යාලය වෙත වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන 306ක මුදලින් දිගුකාලීන පුහුණුව මත එ.ජ.ඩො මිලියන 173.1 පමණක් වැයකර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ මුදල ප්‍රතිපාදනයෙන් සියයට 43.4ක් විය. | ගමන් සීමා හේතුවෙන් කථිකාචාර්යවරුන්ට විදෙස්ගත වීමට නොහැකිවූ නිසා කොවිඩ් 19 වසංගතය මඟින් දිගුකාලීන පුහුණුවලට බලපාන ලදි. වර්තමානයේ කථිකාචාර්යවරු කිහිප දෙනෙකු වෙත අර්පනයන් ලැබී ඇති අතර වැඩසටහන් සඳහා උපයෝජනය නොකළ මුදල් භාවිතයෙන් ඔවුන්ගේ දර්ශනපති ආචාර්ය උපාධි සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා මෙම වර්ෂ තුළදී යනු ලැබේ. | ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඇ) | ගුණාත්මක සහ කාර්මික අංශයට අදාළ උසස් තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හවුල් සංවිධාන සමඟ ගිවිසුම් දෙකකට පමණක් එළඹ තිබුණු අතර විදේශ විශ්ව විද්‍යාලය සමඟ කිසිදු අවබෝධතා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො මිලියන 10ක මුළු ප්‍රතිපාදනයෙන් එ.ජ.ඩො මිලියන 0.01ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය ප්‍රදාන යෝජනා ක්‍රමය සඳහා වන මුළු ප්‍රතිපාදනයෙන් සියයට 99.9ක් නියෝජනය වේ. | යෝජනා සඳහා වාර තුනක් නිකුත් කරන ලද අතර යෝජනාවලින් පළමු සහ දෙවන වටය සඳහා යෝජනා 11 අනුමත කර ඇත. | ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අවශ්‍යතා සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඈ) | | ප්‍රසම්පාදන ප්‍රගති වාර්තා අනුව රු.මිලියන 531.5ක් වටිනා ඉලක්කගත ප්‍රසම්පාදනයන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට කැළණිය විශ්ව විද්‍යාලය විසින් සියයට 38ක් නියෝජනය කරන රු.මිලියන 200.746ක ප්‍රසම්පාදන පමණක් ප්‍රදානය කර නිමකර තිබුණු අතර එම ඉලක්කයෙන් සියයට 62ක් නියෝජනය කරන රු.මිලියන 330.7ක ප්‍රසම්පාදන ක්‍රියාත්මක කර නොතිබුණි. | යෝජිත ගොඩනැගිල්ලේ නිම කිරීම සමඟ මෙම කටයුතු සම්බන්ධ වේ. | සැපයුම්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳව නියාමනය සහ අධීක්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | | ප්‍රදානය කරන ලද රු. මිලියන 1,331 වටිනා ප්‍රසම්පාදනවලින් සියයට 51ක් නියෝජනය කරන රු.මිලියන 673.6ක් පමණක් නිමකර තිබුණි. තවද, 2021 වර්ෂයේදී රජරට විශ්වවිද්‍යාලය විසින් ඉලක්කයෙන් සියයට 49ක් නියෝජනය කරන රු.මිලියන 657.6ක් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | සියයට 49ක් උපයෝජනය නොකළ ප්‍රමාණය තුළ විද්‍යාගාර සංවර්ධනය සහ උපකරණ ලබා ගැනීම ඇතුළත් වේ. යෝජිත ගොඩනැගිලි සංකීර්ණය මේ දක්වා නිමකර නොතිබුණු බැවින් රසායනාගාරය සැලසුම් කිරීම හා සංවර්ධනය මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | සැපයුම්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳව නියාමනය සහ අධීක්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | | 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද රු.මිලියන 1,180.5 වටිනා ප්‍රසම්පාදනයන්ගෙන් රු.මිලියන 468.5ක් වටිනා ප්‍රසම්පාදනයන් පමණක් නිමකර නොතිබුණි. | පීඨය දැනට තාවකාලික ගොඩනැගිල්ලක පවතින බැවින් වර්තමාන ගොඩනැගිල්ල සඳහා පවතින වැඩසටහන් වර්තමාන බඳවා ගන්නා සිසුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ප්‍රසම්පාදනයන් නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා ඉලක්ක කර ඇති අතර එමගින් නව සිසුන් බඳවා ගැනීම වැඩිකර ඇත. | -එම- |
| (උ) | | සබරගමුව විශ්ව විද්‍යාලයේ විසින් රු.මිලියන 1,951ක් වටිනා ප්‍රසම්පාදනයන් පිරිනමා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 608.5ක් වටිනා ප්‍රසම්පාදනයන් පමණක් නිමකර තිබුණි. එය සියයට 31ක ප්‍රසම්පාදන ප්‍රගතියක් අත්කරගෙන තිබුණි. | OCBS හයක් (එස්බී/ඒඊ05,15,38, එස්බී/එෆ් 03,08 සහ 09) 2021.12.30 දින පිරිනමා තිබුණු අතර ඒවා 2022දී නිමකරනු ලැබේ. | සැපයුම්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳව නියාමනය සහ අධික්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

| | ක්‍රියාකාරකම | ආරම්භ කිරීමට නියමිත දිනය | ආරම්භ කළ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | රජරට විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2019 ඔක්තෝබර් | 2021.10.25 | වර්ෂ 02 | ආසියානු සංවර්ධන බැංකුව සතුව සැලසුම් කිරීම සහ ගොඩනැගීම සඳහා වන ඉදිකිරීම් වෙනුවෙන් ස්ථාවර ලංසු ලියවිලි නොමැතිවීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුවට සැලසුම් කිරීම සහ ගොඩනැගීමේ ඉදිකිරීම් ක්‍රමය නව දෙයක් විය. එමනිසා ස්ථාවර ලංසු ලියවිලි සකස් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවිය. කෙසේවෙතත්, ණය කල්පිරෙන දිනට පෙර ව්‍යාපෘති කාලය තුළ | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට පියවර ගැනීම අවශ්‍ය අතර අමතර පිරිවැය ඇතිවීම වැලැක්වීමට කොන්ත්‍රාත් කටයුතු කාලීනව නිම කිරීමට සහතික විය යුතුය. |
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2019 ඔක්තෝබර් | 2021.01.21 | වර්ෂ 01 මාස 3 | | |
| (ඇ) | සබරගමුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2019 ඔක්තෝබර් | 2020.12.20 | වර්ෂ 01 මාස 2 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | කැලණිය විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2019 ඔක්තෝබර් | 2020.09.02 | මාස 11 | එනම් 2023 සැප්තැම්බර් වනවිට කැලණිය, සබරගමුව සහ ජයවර්ධනපුර ඉදිකිරීම් තුන සහ 2024 අප්‍රේල් වන විට රජරට ඉදිකිරීම නිම කිරීමට පියවර ගනු ලැබේ. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, උපදේශකවරු තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2019 වර්ෂය අවසාන වනවිට නිම කළ යුතුය. කෙසේවෙතත්, විශ්වවිද්‍යාල හතරෙහි ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශකවරුන් පත් කිරීම වර්ෂ එකේ සිට දෙක දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුව විසින් දෙන ලද නිර්දේශ මත මෙම පැවරුම සඳහා දේශීය උපදේශකවරු සමග විදේශ උපදේශකවරු ඇතුළත් කිරීමට තීරණයක් ගෙන තිබුණි. | ප්‍රමාදවූ කටයුතු ආවරණය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරු පත්කිරීමේ ආරම්භක ප්‍රමාදය හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 03කට මාස 03ක කාලපරිච්ඡේදයක් සඳහා තාවකාලික පදනමින් ඉදිකිරීම් උපදේශක ලෙස ඉංජිනේරුවරුන් තිදෙනෙකු පත්කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී උපදේශකවරු ලෙස ඉහත ඉංජිනේරුවරුන් තිදෙනා සඳහා එකතුව රු.මිලියන 8.39ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරු බඳවා ගැනීම අවලංගු කිරීමෙන් පසු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරු දේශීයව බඳවා ගැනීමේ ප්‍රසම්පාදනය ආරම්භ කර ඇත. විශ්වවිද්‍යාලය තුනෙහි සිවිල් ඉදිකිරීම ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය අතරතුර රජරට විශ්වවිද්‍යාලය හැර කොන්ත්‍රාත් පිරිනමා ඇත. | ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකරණ උපදේශකවරු බඳවා ගන්නා තෙක් රු.මිලියන එකක ප්‍රතිපාදනයක් සහිතව මාස 06ක කාලයක් සඳහා ගෘහනිර්මාණ ශිල්පියෙකු බඳවාගෙන තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඉ) | විශ්වවිද්‍යාල හතරෙහි පීඨ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ආරම්භක ප්‍රධාන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් හතරදෙනා ප්‍රධාන වැඩ සැලැස්ම ඉදිරිපත් කර තිබුණු අතර එය කොන්ත්‍රාත් ගිවිසුමේ කොටසක් වේ. පරතර විශ්ලේෂණය සිදු කිරීමෙන් පසුව ඔවුන් සංශෝධිත ප්‍රධාන වැඩ සැලැස්ම නැවත ඉදිරිපත් කර ඇත. කටයුතුවල ප්‍රගතියත් ප්‍රධන වැඩ සැලසුම් සමඟ පරීක්ෂා කරනු ලැබේ. | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ප්‍රධාන වැඩ සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඇස්තමේනතුගත පිරිවැය රු.මිලියන 3.5ක් සහිතව හිමිකම්පෑම් පිළිබඳ විශේෂඥයකු පත්කර තිබුණු අතර 2021 ඔක්තෝබර් 15 සිට 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 332,000ක් ගෙවා තිබුණි. | අනවශ්‍ය කාල දීර්ඝ කිරීම් හෝ ගෙවීම් වළක්වා ගැනීමට තත්ත්වය සහ කාලය පවත්වා ගනිමින් හිමිකම් ඉල්ලීම් පාලනය කිරීමට ඉංජිනේරු දැනුම, ඉදිකිරීම් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණ සහ ගැටළු නිරාකරණය සහ හිමිකම් ඉල්ලීම් පාලනය පිළිබඳව පෙර අත්දැකීම් සහිත පුද්ගයෙක් මෙම විශාල ඉදිකිරීම් ව්‍යාපෘති හතර සඳහා අත්‍යවශ්‍ය වේ. | අදාළ කටයුතු ඉදිකිරීම් උපදේශක ආවරණය කළ යුතුය. |

### 3.6 ඌන උපයෝජිත සම්පත්

----------------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ ආරම්භ කර වර්ෂ 04 ගතවීමෙන් පසුව 2021 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො මිලියන 145 ණය මුදලින් සියයට 19ක් නියෝජනය කරන එ.ජ. ඩො. මිලියන 27.87ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 52.12කට සමාන එ.ජ.ඩො මිලියන 0.28ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් සංශෝධිත මූල්‍ය ඉලක්කයන්ට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 7,261.72කට සමාන එ.ජ.ඩො මිලියන 36.23ක් උපයෝජනය කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට එම ඉලක්කයන් සියයට 76.9ක් නියෝජනය කරන රු.මිලියන 5,585.32ක් පමණක් ලඟාකරගෙන තිබුණි. ඊට අමතරව සිවිල් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 11,779ක් ඉලක්කගත ප්‍රතිලබ්දීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,667ක් පමණක් උපයෝජනය කර තිබුණි. | 2019.01.17 දින ණය ගිවිසුම අත්සන් කර ඇති අතර ණය බලාත්මක වන දිනය 2019.04.04 විය. සැලසුම් කිරීම සහ ගොඩනැගීම ඉදිකිරීම් සඳහා වන ලංසු ලියවිලි පිළිබඳ අවසන් තීරණයකට එළඹීමට සැලකියයුතු කාලයක් ගතවී ඇත. කොන්ත්‍රාත් 2020 වර්ෂයේදී පිරිනමා තිබේ. ඉදිකිරීම් සිදුකරමින් පවතින අතර මෙම වර්ෂය අවසාන වන විට ඉලක්කගත ප්‍රතිලබ්දීන් ලඟාකර ගැනීමට අපේක්ෂාව වේ. | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාව වැඩිකිරීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

### 3.7 පරිබාහිර කටයුතු

-------------------

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය කැළණිය, රජරට සහ සබරගමුව විශ්වවිද්‍යාල සඳහා කොවිඩ්-19 ආරක්ෂක උපකරණ සහ භාණ්ඩ මිලදී ගැනීමට එකතුව රු. මිලියන 47.16ක් වියදම් කර තිබුණි. කෙසේවෙතත්, එම කටයුතු ව්‍යාපෘතියේ වැඩ විෂය පථය යටතේ නොගැනේ. | පෞද්ගලික ආරක්ෂිත උපකරණ, පීසීආර් යන්ත්‍ර, මාර්ගගත ඉගැන්වීම් සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ මාර්ගගත උසස් අධ්‍යාපනය සඳහා නේවාසිකාගාර සම්බන්ධ කිරීම වැනි කොවිඩ් 19 සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය අයිතම් මිළදී ගැනීම සඳහා විෂය පථයේ සුළු වෙනස්කම් ආසියානු සංවර්ධන බැංකුව අනුමත කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුකූලවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.8** **මතභේදයට තුඩුදෙන ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| කැලණිය විශ්ව විද්‍යාලයේ ඉදිකිරීම්වල සියයට 5ක රඳවා තබාගත් මුදල් කලින් ලබා ගැනීම නිසා රේඛීය අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ එකතුව රු.මිලියන 151.63ක් තැම්පත් කර තිබුණු අතර ආසියානු සංවර්ධන බැංකුව කොන්ත්‍රාත්කරුට සත්‍ය ගෙවීම් සිදුකරන තෙක් මුදල ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. පොදු තැන්පත් ගිණුමට මුදල් ප්‍රේෂණය කිරීමේ හේතුව විගණනයට අනාවරණය කර නොතිබුණි. | 2021.12.31 දින ගිණුම් පියවීමට පෙර අමාත්‍යාංශයන් නැවත ලබා ගැනීමේ අරමුණින් මෙම පිරිවැය වැය ශීර්ෂයට අයකර නොමැත. | ආසියානු සංවර්ධන බැංකුව මාර්ගෝපදේශ සමඟ අනුගතවීම අවශ්‍ය වේ. |

**3.9** **පද්ධති පාලනයන්**

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළදී ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 928.7ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 24ක් නිමකළ යුතුවේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට එම ප්‍රසම්පාදන කටයුතු නිමකර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට මාස හතරක් සඳහා වසා තබන ලදි. තවද, ආනයන සීමා හේතුවෙන් භාණ්ඩ නියමිත වේලාවට බෙදාහැරීමට නොහැකිවූ අතර ප්‍රසම්පාදන කටයුතු නිමකිරීමට නොහැකි විය. | සැපයුම්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳව නියාමනය සහ අධීක්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ප්‍රගති වාර්තා අනුව 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති රු.මිලියන 293.1ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 33ක් විශ්ව විද්‍යාල හතර සිදුකර තිබුණි. | සාමාන්‍යයෙන් ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කරනු ලැබේ. මෙම කටයුතු ක්‍රියාකාරී සැලසුම පිළියෙල කරන අවස්ථාවේදී ඇතිවී නොතිබුණි. | කාලීනය ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ විශ්වවිද්‍යාල හතරෙහි ප්‍රසම්පාදන ප්‍රගතිය අනුව රු.මිලියන 24.7කට ඇස්තමේන්තුගත කරන ලද ප්‍රසම්පාදන කටයුතු 20ක් 2021 දෙසැම්බර් 31 දින අර්ධ වශයෙන් නිමකර තිබුණි. | භාණ්ඩ කොටස් වශයෙන් ලැබීම හෝ එකඟවූ බෙදාහැරීම් කාලය තුළ බෙදාහැර නොමැති විට ගිවිසුම ප්‍රකාරව එය අර්ධ වශයෙන් අවසන් කිරීමට සිදුවේ. | ප්‍රසම්පාදන කටයුතු ඵලදායී ආකාරයට අධීක්ෂණය කළ යුතුය. |